Kingdom of the Netherlands

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (2024)

## මාධ්‍යවේදීන් සහ මහජනතාව සඳහා මාර්ගෝපදේශයක්

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය

www.slpi.lk

# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (2024)

## මාධ්‍යවේදීන් සහ මහජනතාව සඳහා මාර්ගෝපදේශයක්

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය

# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (2024): මාධ්‍යවේදීන් සහ මහජනතාව සඳහා මාර්ගෝපදේශයක්

**මෙම කාර්යය සහාය දක්වන ලද්දේ:**
ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලය විසිනි.

**ව්‍යාපෘති සම්බන්ධීකරණය:**
ව්‍යාපෘති සම්බන්ධීකරණය: ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (SLPI)
96, කිරුළ පාර, කොළඹ - 05, ශ්‍රී ලංකාව.

දුරකථන : 0114 500 155
ඊමේල් : info@slpi.lk
වෙබ් : ww.slpi.lk

ISBN 978-955-1734-22-0

වියාචනය:
මෙම පොතේ අඩංගු කරුණු තෝරා ගැනීම සහ ඉදිරිපත් කිරීම සහ එහි ප්‍රකාශිත අදහස් කතුවරයාගේ වන අතර ඒවා කිසිවිටක ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ (SLPI) හෝ නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලයේ අදහස් පිළිබිඹු නොකරයි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ තානාපති කාර්යාලය මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය අනුමත කරන්නේ හෝ කැපවන්නේ නැත. මෙම ප්‍රකාශනය තුළ භාවිත කර ඇති තනතුරු සහ ද්‍රව්‍ය ඉදිරිපත් කිරීම ඕනෑම රටක, භූමියක, නගරයක, ප්‍රදේශයක හෝ එහි බලධාරීන්ගේ නෛතික තත්ත්වය සම්බන්ධයෙන් හෝ එහි මායිම් හෝ මායිම් සීමා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයෙහි කිසිදු මතයක් ප්‍රකාශ කිරීමක් අදහස් නොකරයි.

# ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (SLPI) යනු ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයින්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා මඟ පෙන්වීම සහ නායකත්වය සැපයීම වෙනුවෙන් පිහිටුවා ඇති ආයතනයකි. ස්වයං නියාමනය සහ වගවීම දිරිමත් කරන ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ද (PCCSL) මෙයට ඇතුළත් වන අතර එය නිවැරදි වාර්තාකරණයට මාර්ගෝපදේශ සපයයි. කුසලතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන පුහුණු අංශය වශයෙන් ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය (SLCJ) කටයුතු කරයි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ අරමුණ වන්නේ මහජනතාවට වගකියන වෘත්තීය මාධ්‍යවේදීන්ගෙන් සමන්විත මාධ්‍ය සමාජයක් නිර්මාණය කිරීමයි.

SLPI ආයතනය යහපාලනය, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කිරීම කෙරිහි උනන්දු වේ. පරිණාමය වෙමින් පවතින ඩිජිටල් භූ දර්ශනය සහ මාධ්‍ය නිදහස සහ වගකීම කෙරෙහි එහි බලපෑම හඳුනා ගනිමින්, අන්තර්ජාල ආරක්ෂණ පනත (OSA) වැනි නැගී එන නියාමන රාමු වඩා හොඳින් අවබෝධ කර ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට මාධ්‍යවේදීන්ට සහාය වීම සඳහා SLPI ආයතනය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කර ඇත. මෙම මුලපිරීම් හරහා, වැරදි තොරතුරු සහ මාර්ගගත හානිවල අභියෝගවලට මුහුණ දෙන අතරම ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කරන මාධ්‍ය පරිසරයක් සඳහා ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය අඛණ්ඩව පෙනී සිටී.



# පටුන


## 1 වන පරිච්ඡේදය

**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත: ප්‍රශ්නෝත්තර මාර්ගෝපදේශයක්**

1. හැඳින්වීම — 07

2. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව — 08

3. අසත්‍ය ප්‍රකාශ සහ වෙනත් වැරදි — 11

4. තහනම් ප්‍රකාශ සම්බන්ධයෙන් පියවර ගැනීමේ ක්‍රියා පටිපාටිය — 14

5. බොට් ගිණුම්, ව්‍යාජ මාර්ගගත ගිණුම් සහ සමායෝජිත ව්‍යාජ හැසිරීම — 16

6. වැරදි විමර්ශනය කිරීම — 18

7. අන්තර්ජාල අතරමැදියන්ගේ වගකීම — 19

8. වැරදි සඳහා පනත යටතේ ඇති වගකීම — 21

1. විවිධ කරුණු — 22

## 2 වන පරිච්ඡේදය

**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (2024) ඇසුරෙන් විවේචනාත්මක සමාලෝචනයක්** — 23

1 වන පරිච්ඡේදය

# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත: ප්‍රශ්නෝත්තර මාර්ගෝපදේශයක්

සකස් කළේ:
තාක්ෂණ, මාධ්‍යය සහ විද්‍යුත් සන්නිවේදන නීති
පිළිබඳ නීති උපදේශක | පර්යේෂක
**අශ්විනි නටේසන්**

සමාලෝචනය කළේ:
නීතිඥ
**තිශ්‍ය වේරගොඩ**



# 01 හැඳින්වීම

2024 ජනවාරි 24 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සම්මත කරන ලදී. හානිදායක මාර්ගගත හැසිරීම් ඵලදායීව ආමන්ත්‍රණය කිරීමට සහ නිවැරදි කිරීමට සහ මාර්ගගත ප්‍රකාශනය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ("මාර්ගගත ආරක්ෂණ පනත") සම්මත කරන ලදී. අනෙකුත් විධිවිධාන අතර, ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් විය හැකි හෝ විවිධ පන්තිවලට අයත් තැනැත්තන් අතර එදිරිවාදී සහ වෛරී හැඟීම් ප්‍රවර්ධනය කිරීම හෝ ආගමික වතාවත් හෝ ආගමික පූජාවන්හි නීත්‍යනුකූලව යෙදී සිටින යම් රැස්වීමකට බාධා කරන අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම මෙම පනත මගින් තහනම් කරයි.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ කේන්ද්‍රීය අරමුණ වන්නේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවීමයි. අනෙකුත් කරුණු අතර, මාර්ගගත වගවීම සහතික කිරීම, තහනම් ප්‍රකාශයන් කවරේද යන්න තීරණය කිරීම සහ එවැනි අන්තර්ගත ඉවත් කිරීමට අන්තර්ජාල සේවා සපයන්නන්ට නිර්දේශ කිරීම යනාදී විධාන නිකුත් කිරීම, විමර්ශන පැවැත්වීම සහ තහනම් අන්තර්ගත ඉවත් කිරීම බලාත්මක කිරීම යනාදී පුළුල් බලතල මෙම කොමිෂන් සභාවට ඇත. සමාජ මාධ්‍ය වේදිකා වැනි අන්තර්ජාල සේවා අතරමැදියන් නියාමනය කිරීමට, සහ අවශ්‍ය විටෙක ක්‍රියාමාර්ග ගැනීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත. හානිකර අන්තර්ගතයන් ඉවත් කිරීම, දඬ නියම කිරීම හෝ දඩ මුදල් අය කිරීම මෙයට ඇතුළත් විය හැකිය. සාරාංශයක් ලෙස ගතහොත්, අනෙකුත් ඒවා අතර, මාර්ගගත ක්‍රියාකාරකම් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන්නේ නම් හෝ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට හෝ කීර්ති නාමයට බලපාන්නේ නම් හෝ ප්‍රජාවන් තුළ නොසන්සුන්තාවයක් ඇති කරන්නේ නම් ඊට මැදිහත් වීමට ද කොමිෂන් සභාවට බලතල ඇත.


මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ අරමුණ අන්තර්ජාලයේ හානිකර ක්‍රියාකාරකම් තහනම් කිරීම (උදාහරණයක් ලෙස මහජන සාමයට තර්ජනයක් විය හැකි අසත්‍ය ප්‍රකාශ) සහ කාන්තාවන් හා ළමයින් මාර්ගගත අපයෝජනයෙන් ආරක්ෂා කිරීම වුවද, පනතේ අනෙකුත් විධිවිධානවලින් පැන නගින ගැටළු නොසලකා හැරිය නොහැකිය.
"අසත්‍ය ප්‍රකාශ" "එදිරිවාදී" සහ "වෛරී හැඟීම්" වැනි අපැහැදිලි පාරිභාෂික යෙදුම් සම්බන්ධව බලධාරීන් විසින් විවිධ අර්ථකථනවලට එළඹිය  හැකි බව නීති විශාරදයින්, මාධ්‍ය ආයතන සහ සිවිල් සමාජ සංවිධාන කිහිපයක් මත පළ කර ඇත. මෙය රජය හෝ අනුබද්ධ පුද්ගලයින් පිළිබඳ සාධාරණ විවේචන මැඩපැවැත්වීම සඳහා හෝ විරුද්ධ මත මැඩපැවැත්වීම සඳහා පනත අනිසි ලෙස භාවිතා කළ හැකි බවට විවේචන ඉදිරිපත් වී තිබේ.

මතභේදාත්මක හෝ විවේචනාත්මක යැයි සැලකිය හැකි අදහස් බෙදා ගන්නා මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන, ක්‍රියාකාරීන් සහ පුද්ගලයින් ඉලක්ක කිරීමට මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත භාවිතා කළ හැකි බවට ද සැකයක් මතු වී තිබේ. එමගින්, භාෂණයේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස වැනි ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් උල්ලංඝනය විය හැකි තත්වයක් නිර්මාණය වී තිබේ. විශේෂයෙන්ම මාධ්‍යවේදීන්, "අසත්‍ය ප්‍රකාශ" යන අර්ථ නිරූපනය යටතේ විමර්ශන වාර්තාකරණය හෝ තොරතුරු හෙළිදරව් කිරීම සීමා කිරීමට පනත මෙවලමක් ලෙස භාවිතා කළ හැකි බවට අදහස් ඉදිරිපත්ව ඇත.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ යහපත් ගුණාංග අන්තර්ගත වූවත් පනත නියාමනය කිරීම සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අතර තුලනයක් ඇතිකිරීමේ ගැටළුවට මුහුණ දී සිටී. 2024 අගෝස්තු මාසයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධන පාර්ලිමේන්තුව මගින් තවමත් සම්මත කර නොමැත.  මෙම ප්‍රකාශනය සම්පාදනය කිරීමේ දින වන විටත් යෝජිත සංශෝධන කවදා සම්මත හෝ ඇතුළත් වේද යන්න හෝ නව සංශෝධන ආදේශ කරනු ලබන්නේද යන්න පිළිබඳව වැඩිදුර තොරතුරු නොමැත. එම නිසා මෙම පනතේ විධිවිධාන අනාගතයේදී සංශෝධනය කරන්නේ කෙසේදැයි බැලීමට ඉතිරිව ඇත. අද පවතින පනත මත පදනම්ව නිර්මාණය කර ඇති ප්‍රශ්නෝත්තර, පනත පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීමට අදහස් කරන අතර පනත සම්පූර්ණයෙන්ම කියවීම සඳහා ආදේශකයක් නොවේ.

---

**අශ්විනි නටේසන්**
**2025 අගෝස්තු 15**



02

# විෂය පථය, යෙදවීම සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව

### 1. 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යනු කුමක්ද?

පනතේ පූර්විකාව අනුව, එය මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටු වීම සඳහා වන පනතක් වන අතර, ඊට අමතරව,හානිකර මාර්ගගත ප්‍රකාශවලින් පුරවැසියන්ව ආරක්ෂා කිරීම සහ එවැනි මාර්ගගත ස්ථාන හඳුනා ගැනීම සහ එවැනි තහනම් ප්‍රකාශ සඳහා වන මූල්‍යකරණය මැඩ පැවැත්වීම ඇතුළුව තහනම් අරමුණු සඳහා මාර්ගගත වේදිකා අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම අරමුණු කෙරේ.

### 2. මෙම පනත අදාළ වන්නේ කවර තැනැත්තන්ටද?

ශ්‍රී ලාංකික පුරවැසියන් සම්බන්ධ වැරදි:

- ඕනෑම අපරාධයක් ශ්‍රී ලාංකික පුරවැසියෙකු සම්බන්ධයෙන් සිදු කරන්නේ නම්, එම අපරාධය රට තුළ හෝ ඉන් පිටත සිදු වුවද අදාළ වේ.
- සිදුකරනු ලබන අලාභය, හානිය හා පීඩාව: මෙය රට තුළ හෝ පිටත සිදු වන සිදුවීම් ඇතුළත් වන අතර, එය රාජ්‍යයට හෝ ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකුට බලපායි.
- ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් සිදු කරන වැරදි: අපරාධය සිදු කරන ස්ථානය කුමක් වුවත්, පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලාංකික පුරවැසියන් ඔවුන්ගේ ක්‍රියාවන්ට වගකීමට ලක්කරයි.

### 3. පනතේ අරමුණු මොනවාද?

ප්‍රධාන අරමුණු වන්නේ:

- මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා තහනම් මාර්ගගත ප්‍රකාශ මගින් සිදුවන පීඩාවකින් පුද්ගලයන් ආරක්ෂා කිරීම.
- අපහාසාත්මක හෝ අගතිගාමී මාර්ගගත ප්‍රකාශ වැළැක්වීමෙන් අධිකරණයේ බලය සහ අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම.
- වැරදි සිදු කිරීම සඳහා බොට් ඇතුළු මාර්ගගත ගිණුම් අනිසි ලෙස භාවිතා කිරීම හඳුනා ගැනීම සහ වැළැක්වීම.
- නැවත නැවතත් තහනම් ප්‍රකාශ ප්‍රකාශයට පත් කරන මාර්ගගත ස්ථාන සඳහා මූල්‍යකරණය, ප්‍රවර්ධනය සහ වෙනත් ආකාරයේ සහාය සැපයීම අධෛර්යමත් කිරීම.

### 4. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ විධිවිධාන සහ වෙනත් ලිඛිත නීතියක් අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති කුමක් සිදුවේද?

එවැනි යම් ගැටීමක් ඇති වුවහොත් මාර්ගගත ආරක්ෂණ පනතේ විධිවිධාන අනෙකුත් ඕනෑම නීතියක් අභිබවා යයි.

## 5. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව යනු කුමක්ද? සහ එහි බලතල මොනවාද?

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව ("කොමිෂන් සභාව") යනු මාර්ගගත ආරක්ෂණ නීති නියාමනය කිරීමට සහ බලාත්මක කිරීමට පිහිටුවා ඇති සංස්ථාපිත මණ්ඩලයකි.

කොමිෂන් සභාවට පහත බලතල ඇත:

- අන්තර්ගත නියාමනය - යම් තහනම් ප්‍රකාශයක් හේතුවෙන් අහිතකර ලෙස බලපෑමට ලක්ව ඇති තැනැත්තන්ට එකී තහනම් ප්‍රකාශයට ප්‍රතිචාර දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස නියම කරමින් යම් තහනම් ප්‍රකාශයක් පළ කරනු ලැබ ඇති හෝ සන්නිවේදනය කරනු ලැබ ඇති හෝ යම් තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම සඳහා ස්වකීය සේවාවන් භාවිත කරනු ලැබ ඇති තැනැත්තන්ට, අන්තර්ජාල සේවා සපයන්නන්ට හෝ අන්තර්ජාල අතරමැදියන්ට විධාන නිකුත් කළ හැකිය. තවද, එවැනි අන්තර්ගතයන් ඉවත් කිරීමට හෝ ප්‍රවේශය අක්‍රීය කිරීමට ද නියෝග කළ හැකිය.

- දැන්වීම් නිකුත් කිරීම - තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීම නවත් වන ලෙස පුද්ගලයන්ට හෝ අන්තර්ජාල වේදිකාවලට දැනුම් දීම.

- අධිකරණ වෙත යොමු කිරීම් - අපහාසාත්මක හෝ අගතිගාමී සන්නිවේදනයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකරණය වෙත යොමු කළ හැකිය.

- අන්තර්ජාල සේවා සපයන්නන් වෙත නිර්දේශ නිකුත් කිරීම - අනිවාර්ය බලාත්මක කිරීමකින් තොරව තහනම් ප්‍රකාශ ඉවත් කිරීම යෝජනා කළ හැකි ය.

- මහජන දැනුවත් කිරීම - අසත්‍ය තොරතුරු වලට එරෙහිව මාර්ගගත ද්වාරයක් පවත්වාගෙන යා හැකිය.

- ප්‍රකාශිත මාර්ගගත ස්ථාන - පනත යටතේ ස්ථාන නිශ්චිතව දක්වා ඒවාට ප්‍රවේශය අක්‍රීය කිරීමට නිර්දේශ කළ හැකිය.

- විමර්ශන - එහි වපසරිය තුළ ඇති කරුණු විමර්ශනය කිරීමට බලය ඇත.

- අන්තර්ජාල වේදිකා නියාමනය කිරීම - චර්යාධර්ම සංග්‍රහ නිකුත් කිරීමට, සමාජ මාධ්‍ය වෙබ් අඩවි ලියාපදිංචි කිරීමට සහ අන්තර්ජාලය පදනම් කරගත් සන්නිවේදන සේවා සඳහා නීති රීති සැකසීමට හැකිය.

- උපදේශන සහ උපදේශක භූමිකාව - පාර්ශවකරුවන්ගෙන් විමසා මාර්ගගත ආරක්ෂාව පිළිබඳව රජයට උපදෙස් දිය හැකිය.

- පරිපාලන සහ මෙහෙයුම් බලතල - දේපළ අත්පත් කර ගැනීමට, ගිවිසුම්වලට එළඹීමට, පොලිස් සහාය ලබා ගැනීමට සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමට හැකිය.

- සාමාන්‍ය බලතල - පනත යටතේ එහි කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකිය.

- ශ්‍රී ලංකාවේ මාර්ගගත ආරක්ෂණ ගැටළු විසඳීම සඳහා කොමිෂන් සභාව මූලික අධිකාරියක් ලෙස ක්‍රියා කරනු ඇත.

## 6. කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කරන්නේ කෙසේද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. සාමාජිකයන් හට තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා, පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල සාමාජිකයින්ට විශේෂඥ දැනුමක් තිබිය යුතුය.

## 7. කොමිෂන් සභාව සමන්විත වන්නේ සාමාජිකයින් කී දෙනෙකුගෙන් ද?, ඔවුන්ගේ නිල කාලය කොපමණ ද?

කොමිෂන් සභාව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. සෑම සාමාජිකයෙකුටම වසර තුනක ධුර කාලයක් ඇති අතර, අතිරේක ධුර කාලයක් සඳහා නැවත පත් කිරීමේ හැකියාව ද ඇත. සාමාජිකයෙකුගේ තනතුරක් පුරප්පාඩු වුවහොත්, ඉතිරි ධුර කාලය සඳහා ආදේශකයෙකු පත් කරනු ලැබේ.

## 8. කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වීමට පුද්ගලයෙකු නුසුදුස්සකු වීමට හේතු මොනවාද?

නුසුදුස්සකු වීමට හේතු අතර:

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කරනු ලැබ හෝ පත් කරනු ලැබ ඇත්නම්

- ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම නතර වේ නම්

- කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ස්වකීය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සබඳතාවක් ඇත්නම්

- නිසි අධිකාරියක් විසින් සිහිවිකල් තැනැත්තකු බවට අනාවරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්

- බුන්වත්භාවයට හෝ වස්තුභංගත්වයට පත් තැනැත්තෙකු නම්

- ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් කර ඇත්නම් හෝ බන්ධනාගාරගත කිරීම සඳහා ආඥාවක් නිකුත් කර ඇත්නම්

- වලංගු හේතුවක් නොමැතිව, කොමිෂන් සභාවේ අඛණ්ඩ රැස්වීම් තුනකට පැමිණ නොමැති නම්

## 9. කොමිෂන් සභාවේ සාමාජිකයන්ව නිලයෙන් ඉවත් කළ හැකි ද? එසේ නම්, කෙසේද?

ඔව්, ඉහත පැහැදිලි කර ඇති පරිදි, ශාරීරික හෝ මානසික දුර්වලතාවය, රාජකාරි ඉටු කිරීමට නොහැකි වීම හෝ පනත යටතේ නුසුදුස්සකු වීම වැනි හේතු මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයාට සාමාජිකයන් ඉවත් කළ හැකිය. එම ක්‍රියාවලියට මාස 3ක් ඇතුළත අවසන් කළ යුතු විධිමත් විභාගයක් ඇතුළත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු, ජනාධිපතිවරයා විසින් එවැනි සාමාජිකයෙකු ඉවත් කිරීමට හේතු සහ ඉවත් කිරීම ක්‍රියාත්මක වන දිනය සඳහන් කරමින් ලිපියක් මගින් දැනුම් දෙනු ලැබේ.

## 10. කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ කාර්යභාරය කුමක්ද?

සභාපතිවරයා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතරින් පත් කරනු ලැබේ. සභාපතිවරයා රැස්වීම්වල මුලසුන දරයි, කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරයි, හා එය නිල වශයෙන් නියෝජනය කරයි. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී, නියෝජ්‍ය සභාපතිවරයා විසින් ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයාගේ නිල කාලය වසර 3 කි.

## 11. කොමිෂන් සභාව තීරණ ගන්නේ කෙසේද, සහ එහි රැස්වීම් සඳහා ගණපූරණ අවශ්‍යතාවය කුමක්ද?

සභාපති හෝ නියෝජ්‍ය සභාපති ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකුගේ ගණපූරණයක් අවශ්‍ය වන කොමිෂන් සභා රැස්වීම්වලදී බහුතර ඡන්දයෙන් තීරණ ගනු ලැබේ. යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට තීරක ඡන්දයක් ඇත.

## 12. කොමිෂන් සභාව සහ එහි සාමාජිකයින් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී ලබා දෙන ආරක්ෂාවන් මොනවාද?

පනත යටතේ සද්භාවයෙන් කරන ලද ක්‍රියාවන් සඳහා කොමිෂන් සභාව, කොමිෂන් සභාවට සහාය වන සාමාජිකයින්, කාර්ය මණ්ඩලය සහ විශේෂඥයින් නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා කර ඇත. ඊට අමතරව, ඔවුන්ගේ රාජකාරිවලට අදාළ නඩු පැවරීම් හෝ නඩු විභාගවලදී දැරීමට සිදුවන වියදම් කොමිෂන් සභාවේ අරමුදලින් ආවරණය කෙරේ.

## 13. කොමිෂන් සභාවට අරමුදල් සැපයීම සහ වගවීම සහතික කරන්නේ කෙසේද?


කොමිෂන් සභාව පාර්ලිමේන්තු ප්‍රතිපාදනවලින් ලබාගත් තමන්ගේම අරමුදලක් පවත්වාගෙන යයි. විගණනය කරන ලද ගිණුම් පවත්වාගෙන යාමට සහ එහි ක්‍රියාකාරකම් සහ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තා අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අතර, අමාත්‍යවරයා ඒවා සමාලෝචනය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.

## 14. කොමිෂන් සභාවට රීති සෑදිය හැකිද? එසේ නම්, කුමන අරමුණු සඳහාද?

ඔව්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවට පහත සඳහන් කරුණු සඳහා රීති සෑදීමේ බලය ඇත.

- අන්තර්ජාල සේවා සපයන්නන් සහ අතරමැදියන් සඳහා අවශ්‍ය ආරක්ෂක පිළිවෙත් සහ කාර්යපටිපාටිය නිශ්චිතව දක්වමින් චර්යාධර්ම සංග්‍රහ නිකුත් කිරීම සඳහා.
- සමාජ මාධ්‍ය වේදිකා නියාමනය කිරීම, ඇතුළුව එවැනි සේවාවන් සපයන වෙබ් අඩවි පනත යටතේ ලියාපදිංචි කළ යුතු ආකාරය

කොමිෂන් සභාව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස විසි හතරක් ඇතුළත සාදනු ලැබිය යුතු අතර ඒවා රීති සෑදීමට පෙර, සති දෙකකට නොඅඩු කාලයක් සඳහා මහජන අදහස් විමසීමක් කරනු ලැබිය යුතුය.



03

# අසත්‍ය ප්‍රකාශ සහ වෙනත් වැරදි

## 1. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ "අසත්‍ය ප්‍රකාශයක්" නිර්වචනය කරන්නේ කෙසේද?

අසත්‍ය ප්‍රකාශයක් යනු එහි ප්‍රකාශකයා විසින් එය වැරදි හෝ සත්‍ය නොවන බව දැන හෝ විශ්වාස කරන්නා වූ ද විශේෂයෙන් ම රැවටීමේ හෝ නොමග යැවීමේ චේතනාවෙන් සිදු කරන්නා වූ දප්‍රකාශයක් ලෙස අර්ථ දැක්වේ.

එය සද්භාවයෙන් (සත්‍ය යැයි විශ්වාස කරමින්) කරන ලද අනතුරු ඇඟවීමක්, මතයක් හෝ අධ්‍යාරෝපණයක් ඇතුළත් නොවේ

## 2. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ "තහනම් ප්‍රකාශයක්" යනු කුමක්ද?

**පහත සඳහන් ප්‍රකාශන "තහනම් ප්‍රකාශ" ලෙස සැලකේ.**

**(1) පහත සඳහන් ප්‍රතිවිපාක ඇති කරන "අසත්‍ය ප්‍රකාශ" සන්නිවේදනය කිරීම**

අ. ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජන: ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් ඇති කරවන හෝ විවිධ පන්තිවලට අයත් තැනැත්තන් අතර එදිරිවාදී සහ වෛරී හැඟීම් ප්‍රවර්ධනය කරන අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම.

ආ. අධිකරණයට අපහාස කිරීම: අධිකරණයට අපහාස වන අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම.

ඇ. කැරලි ගැසීමක් සිදුකිරීමට ප්‍රකෝප කරවීම: ප්‍රකෝප කරවීමෙන් හෝ පෙළඹවීමෙන් කැරලි ගැසීමේ වරද සිදුවිය හැකි බවට වූ චේතනාවෙන් ම හෝ ඒ බව දැන දැන ම, යම් තැනැත්තකු විසින්, ද්වේශ සහගතව හෝ නිකරුණේ අසත්‍ය ප්‍රකාශයක්

ඈ. ආගමික රැස්වීම්වලට බාධා කිරීම: අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්හි නීත්‍යනුකූලව යෙදී සිටින යම් රැස්වීමකට ස්වේච්ඡාවෙන් ම බාධා කිරීම.

ඉ. ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කිරීම :යම් පන්තියකට අයත් තැනැත්තන්ගේ ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කිරීමේ ඒකාන්ත සහ ද්වේශ සහගත චේතනාවෙන්, අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් ඒ පන්තියේ ආගමට නැතහොත් ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලැබේ.

ඊ. වංචා කිරීම: ඕනෑම දේපලක් භාරදීමට හෝ යමක් කිරීමට හෝ යමක් කිරීමට අතපසු කිරීමට මාර්ගගත ගිණුමක් හෝ වේදිකාවක් හරහා අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් ඕනෑම පුද්ගලයෙකු වංචක ලෙස හෝ වංක ලෙස පොළඹවා ගැනීම

උ. කැරලි ගැසීමට හෝ මහජනයා අතර බියක් හෝ තැතිගැනීමක් ඇතිකිරීම: ශ්‍රී ලංකා නාවික හමුදාවේ, යුද්ධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් නිලධරයකු, නාවිකයකු, සෙබළකු හෝ ගුවන් නැවියකු කැරලි ගැස්වීමේ චේතනාවෙන් හෝ මහජනයා අතර බියක් හෝ තැතිගැන්මක් ඇති කරවීමේ චේතනාවෙන් යම් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කර එමගින් රජයට විරුද්ධ වරදක් හෝ මහජන සාමයට විරුද්ධව වරදක් සිදු කිරීමට යම් තැනැත්තකු පොලඹවන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනලැබේ.

**(2) පෞද්ගලික තොරතුරු හරහා හිරිහැර කිරීම:**

**වෙනත් යම් තැනැත්තකුට හිරිහැර කිරීමේ චේතනාවෙන්, ඉලක්කගත තැනැත්තාගේ හෝ ඉලක්කගත තැනැත්තාට සම්බන්ධ තැනැත්තකුගේ යම් පෞද්ගලික තොරතුරක් පළ කිරීමෙන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉලක්කගත තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට හිරිහැරයක් සිදු කරවන, ප්‍රකාශයක් සිතාමතා ම සිදු කරන හෝ සන්නිවේදනය කිරීම, එහි ප්‍රතිඵලයක් ලෙස හිරිහැර වීම සිදුවීම.**

## 3. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම වරදක් වන්නේ කෙසේද?

අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම වරදකි, එහිදී එවැනි ප්‍රකාශයක්-

- ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් එල්ල කරයි.

- විවිධ පන්තිවලට අයත් තැනැත්තන් අතර එදිරිවාදී සහ වෛරී හැඟීම් ප්‍රවර්ධනය කරයි.

මීට අමතරව, අපහාසයට තුඩු දෙන, අසත්‍ය ප්‍රකාශ, කෝලාහල ඇති කිරීම, ආගමික රැස්වීම්වලට බාධා කිරීම, ආගමික හැඟීම් රිදවීම, වංචා කිරීම, කැරලි ගැසීමට පෙළඹවීම මෙම පනත යටතේ වැරදි වේ.

## 4. ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් වන අසත්‍ය ප්‍රකාශයක් කිරීමට අදාළ දඬුවම් මොනවාද?

දඬුවම්වලට ඇතුළත් වන්නේ:

- වසර පහක් දක්වා සිර දඬුවම්.

- රුපියල් ලක්ෂ පහක් දක්වා දඩ.

වරදේ බරපතලකම අනුව අනුව සිර දඬුවම් සහ දඩ යන දෙකම.

## 5. අපහාසයට තුඩු දෙන අසත්‍ය ප්‍රකාශයක් යනු කුමක්ද?

අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම (මාර්ගගත ගිණුමක් හෝ මාර්ගගත ස්ථානයක් හරහා) අධිකරණයට අපහාසයක් යැයි කරුණු අනාවරණය වුවහොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව දඬුවම් නියම කිරීම සඳහා අදාළ වේ.

## 6. අසත්‍ය ප්‍රකාශයක් මගින් "ප්‍රකෝප කිරීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

මෙයින් අදහස් කරන්නේ අන් අයව ප්‍රකෝප කිරීමට ද්වේෂ සහගත ලෙස අසත්‍ය ප්‍රකාශ භාවිතා කිරීම, මහජන නොසන්සුන්තාවයක් හෝ කැරලි කෝලාහල ඇති කිරීමට අදහස් කිරීමයි. ඒ ප්‍රකෝප කරවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කැරලි කෝලාහල ඇති වුවහොත්, වැරදිකරුවන්ට වසර පහක් දක්වා සිර දඬුවම් නියම කළ හැකිය, නැතහොත් රුපියල් 500,000 දක්වා දඩයක් හෝ ඒ දෙකම නියම විය හැකිය. කැරලි ගැසීමේ වරද සිදු නොකළහොත්, ප්‍රකෝප කළ තැනැත්තාට වසර තුනක් දක්වා සිර දඬුවම් හෝ රුපියල් 300,000 දක්වා දඩයක් හෝ ඒ දෙකම නියම විය හැකිය.

## 7. ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්හි නීත්‍යනුකූලව යෙදී සිටින යම් රැස්වීමකට ස්වේච්ඡාවෙන් බාධා කරන "අසත්‍ය ප්‍රකාශ" සහ "යම් පන්තියකට අයත් තැනැත්තන්ගේ ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කරන "අසත්‍ය ප්‍රකාශ" වෙන වෙනම වරදක් ලෙස සලකනවාද?

ඔව්, ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්හි ස්වේච්ඡාවෙන් බාධා කිරීමට අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම සහ ආගමික විශ්වාස හෝ හැඟීම් නින්දා කිරීමට ඒකාන්ත සහ ද්වේශ සහගත චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම යන දෙකම වෙන වෙනම අපරාධයන් වේ. මෙම අපරාධ සඳහා වසර තුනක් දක්වා සිර දඬුවම් හෝ රුපියල් ලක්ෂ තුනක් දක්වා දඩයක් හෝ ඒ දෙකම ලබා දිය හැක.

## 8. මෙම පනත යටතේ 'මාර්ගගතව වංචාව' යනු කුමක්ද?

මාර්ගගත වංචාවට මාර්ගගත ගිණුම් හෝ ස්ථාන හරහා අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම අදාළ වන්නේ:

- යම් අයෙකුට දේපළක් භාරදීමට හෝ යම් තැනැත්තකු ළඟ දේපලක් තබා ගැනීමට කැමැත්ත දැක්වීමට වංචක ලෙස හෝ වංක ලෙස පෙළඹවීම.

- තැනැත්තකුගේ ශරීරයට, මනසට, කීර්ති නාමයට හෝ දේපළවලට හානි කිරීම හෝ රජයට පාඩුවක් සිදු කිරීම.

මෙම වරදට වසර හතක් දක්වා සිර දඬුවම් සහ රුපියල් ලක්ෂ හතක් දක්වා දඩයක් හෝ ඒ දෙකම ඇතුළත් දැඩි දඬුවම් ලැබේ.

## 9. අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මර්ගගතව වංචා කිරීම. යනු කුමක්ද, එයට දඬුවම් කරන්නේ කෙසේද?

යමෙක් අන්තර්ජාලයේ වෙනත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටින විට, එක් අනන්‍යතාවයක් තවත් අනන්‍යතාවයකට ආදේශ කරන විට හෝ අන් අයව රවටා ගැනීමට තම අනන්‍යතාවය වැරදි ලෙස ඉදිරිපත් කරන විට මෙය සිදු වේ. දඬුවම්වලට වසර තුනක් දක්වා සිර දඬුවම් සහ රුපියල් ලක්ෂ තුනක් දක්වා දඩයක් හෝ ඒ දෙකම ඇතුළත් වේ.

## 10. මහජන සාමයට තර්ජනයක් වන අසත්‍ය තොරතුරු පතුරුවා හැරීම පනත මගින් වළක්වන්නේ කෙසේද?

සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන් හෝ නිලධාරීන් කැරලි ගැස්වීමේ චේතනාවෙන්; මහජනයා අතර බියක් හෝ තැතිගැන්වීමක් ඇති කරවීමේ චේතනාවෙන්; හෝ රජයට විරුද්ධ වරදක් කිරීමට පෙළඹවීමේ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශ බෙදා හැරීම වරදකි. එවැනි වරදකට වසර හතක් දක්වා සිර දඬුවම් සහ රුපියල් ලක්ෂ හතක් දක්වා දඩයක් හෝ ඒ දෙකම නියම විය හැකිය.

## 11. පනත 'යටතේ හිරිහැර කිරීම' සහ 'පෞද්ගලික තොරතුරු' සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කෙසේද?

හිරිහැර කිරීම යනු පුද්ගලයෙකුට තර්ජනය කිරීම, තැති ගැන්වීම හෝ පීඩාවට පත් කිරීම හෝ පුද්ගලයෙකුගේ අභිමානය උල්ලංඝනය කිරීම හෝ බියගන්වනසුලු, අවමන් සහගත, එදිරිවාදී, නින්දා සහගත හෝ වරදකාරී පරිසරයක් නිර්මාණය කිරීමේ බලපෑමක් ඇති හෝ හෝ එවැනි සියලු බලපෑම් ඇති යම් ක්‍රියාවක් හෝ හැසිරීමක් අදහස් වේ. මෙම සන්දර්භය තුළ පෞද්ගලික තොරතුරු යනු යම් තැනැත්තකු විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි යම් ඡායාරූපයක්, හඬ පටයක හෝ වීඩියෝ පටයක විස්තර වේ.

වෙනත් පුද්ගලයෙකුට හිරිහැර කිරීමේ චේතනාවෙන් පෞද්ගලික තොරතුරු ප්‍රකාශයට පත් කරන විට වරදක් සිදු වේ. වසර පහක් දක්වා සිර දඬුවම් හෝ රුපියල් ලක්ෂ පහක් දක්වා දඩයක් හෝ ඒ දෙකම දඬුවම්වලට ඇතුළත් වන අතර, නැවත නැවත වරදක් සිදු වුවහොත් දඩ මුදල දෙගුණ විය හැකිය.

## 12. පනත යටතේ ළමයින් ආරක්ෂා කිරීම සඳහා විශේෂ විධිවිධාන තිබේද?

ඔව්, ළමයින් පිළිබඳ අසත්‍ය ප්‍රකාශ සම්බන්ධ වැරදි සඳහා වැඩි දඬුවම් ඇතුළත් වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ මීට පෙර සඳහන් කර ඇති වැරදි සඳහා දඩ සහ සිර දඬුවම් ද නියම කළ හැකිය. ළමයෙකුට අදාළව අපයෝජන ස්වභාවයෙන් යුතු හෝ කාමෝද්දීපන ස්වභාවයෙන් යුතු ප්‍රකාශයට පත් කිරීම වසර 2 කට නොඅඩු සහ වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිර දඬුවම් හෝ රුපියල් මිලියනයක් දක්වා දඩයක් හෝ ඒ දෙකටම යටත් විය හැක. ඒ දඬුවම්වලට අමතරව අධිකරණයට බලපෑමට ලක් වූ දරුවාට හෝ දරුවන්ට වන්දි ගෙවීමට ද නියෝග කළ හැකිය.

## 13. දණ්ඩ නීති සංග්‍රහය යටතේ ද ආවරණය වන ළමයින්ට එරෙහි වැරදි සඳහා මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත විශේෂ දඬුවම් නියම කර තිබේද?

ඔව්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ උපලේඛනය යටතේ, දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කර ඇති වැරදි සඳහා වන දඬුවම් සම්බන්ධයෙන් සවිස්තරාත්මක විධිවිධාන ඇතුළත් කර ඇත.



04

# තහනම් ප්‍රකාශ සම්බන්ධයෙන් පියවර ගැනීමේ ක්‍රියා පටිපාටිය

## 1. පුද්ගලයන්ට "තහනම් ප්‍රකාශ" වාර්තා කළ හැක්කේ කෙසේද?

යම් තැනැත්තෙකුට තහනම් ප්‍රකාශයක් එය ශ්‍රී ලංකාවේ පරිශීලකයන් විසින් දකිනු ලබන, අසනු ලබන හෝ වෙනත් ආකාරයකයකට දැනගනු ලබන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකිය. (3 වන පරිච්ඡේදය යටතේ විස්තර කර ඇති පරිදි)

පුද්ගලයන්ට ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික අකාරයෙන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවට පැමිණිලි ගොනු කළ හැකිය. පැමිණිල්ලේ වගකිව යුතු පුද්ගලයා/පුද්ගලයින්ගේ විස්තර අඩංගු විය යුතු අතර, ඇති නම්, URL ලිපිනයන් හෝ ස්ථානය වැනි මාර්ගගත ගිණුම් හැඳුනුම් ඇතුළුව ඇතුළත් කළ යුතුය. පැමිණිල්ලේ පිටපත් අදාළ පාර්ශවයන්ට, එනම්, හැකි නම්, එවැනි තහනම් ප්‍රකාශයක් කරන පුද්ගලයාට සහ අන්තර්ජාල අතරමැදියාට හෝ අන්තර්ජාල සේවා සපයන්නාට යැවිය යුතුය.

## 2. පැමිණිල්ලක් ලැබීමෙන් පසු කොමිෂන් සභාව අනුගමනය කරන පියවර මොනවාද?

කොමිෂන් සභාව පැමිණිලි විමර්ශනය කර පහත සඳහන් දෑ කළ හැකිය:

- ප්‍රකාශය සංසරණය වීම නැවැත්වීමට චෝදනා ලද තැනැත්තාට දැන්වීමක් නිකුත් කිරීම.
- අන්තර්ජාල සේවා සපයන්නන්ට හෝ අතරමැදියන්ට (මෙම තාක්ෂණික පද 7 වන පරිච්ඡේදය යටතේ පැහැදිලි කර ඇත) ප්‍රවේශය අක්‍රීය කිරීමට හෝ තහනම් ප්‍රකාශය ඉවත් කිරීමට නියෝග කිරීම.
- නිවේදනයට අනුකූල නොවන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

## 3. තහනම් ප්‍රකාශවලට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම පනත සහතික කර තිබෙන්නේ කෙසේද?

- තහනම් ප්‍රකාශන වෙත ප්‍රවේශය ඉවත් කිරීමට හෝ අවහිර කිරීමට අනතර්ජාල අතරමැදියන්ට නියම කිරීම.
- මූලික නියෝග නොසලකා හරිනු ලැබුවහොත්, එවැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ නියෝග සඳහා යොමු කිරීම.

## 4. පනත මගින් හානිකර අන්තර්ගතයන්ට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග සහතික කරන්නේ කෙසේද?

කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද දැන්වීම්, චෝදනාවට ලක්වූ තැනැත්තා හෝ අන්තර්ජාල අතරමැදියා විසින්, අදාළ සිද්ධියට අනුව, පැය 24ක් ඇතුළත අනුකූල විය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම අධිකරණ මැදිහත්වීමකට තුඩු දෙන අතර, එහිදී මහේස්ත්‍රාත්වරයෙකුට අන්තර්ගතය ඉවත් කිරීමට හෝ ප්‍රවේශය අක්‍රීය කිරීමට නියෝග කළ හැකිය.

## 5. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ වරදක් කර ඇතැයි කියන පුද්ගලයාට වලංගු "දැන්වීමක් " භාරදීම ලෙස සලකන්නේ කුමක්ද?

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ වලංගු දැන්වීමක් යනු පහත දැක්වෙන ක්‍රමවලින් එකක් හරහා භාරදෙනු ලබන නිවේදනයකි:

1. පුද්ගලිකව භාරදීම - පුද්ගලයාට සෘජුවම භාර දෙනු ලැබේ.

2. තැපැල් සේවාව - තහනම් ප්‍රකාශය සන්නිවේදනය කළ පුද්ගලයාගේ අවසන් වරට දන්නා ලිපිනයට යවනු ලැබේ.

3. විද්‍යුත් මාධ්‍යයන් - විද්‍යුත් තැපෑල, සමාජ මාධ්‍ය ගිණුම හරහා හෝ අදාළ අන්තර්ජාල සේවා සපයන්නාට හෝ අන්තර්ජාල අතරමැදියාට යවනු ලැබේ.

4. වෙනත් සුදුසු ක්‍රම - අදාළ සිද්ධියේ ස්වභාවය මත පදනම්ව කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් ඕනෑම ක්‍රමයක්.

## 6. අගතියට පත් පුද්ගලයෙකුට කොමිෂන් සභාවට නොපැමිණ අධිකරණ නියෝගයක් සඳහා ඉල්ලුම් කළ හැකිද?

ඔව්, බලපෑමට ලක් වූ පුද්ගලයින්ට තහනම් ප්‍රකාශ සංසරණය වීම වැළැක්වීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට නඩුවක් පැවරීමෙන් නියෝගයක් ලබා ගත හැකිය.

"තහනම් ප්‍රකාශය" සන්නිවේදනය කිරීමට අව්‍යාජ මාර්ගගත ගිණුමක් හෝ බොට් භාවිතා කළ පුද්ගලයාගේ අනන්‍යතාවය හෝ ස්ථානය හෙළි කරන ලෙස ඉල්ලා අන්තර්ජාල අතරමැදියාට එරෙහිව සිවිල් නඩුවක් පැවරීමට වින්දිතයාට දිසා අධිකරණයට ද යා හැකිය.

## 7. චෝදනා ලත් තැනැත්තාගේ අනන්‍යතාවය නොදන්නා විට කුමක් සිදුවේද?

තහනම් ප්‍රකාශ සඳහා වගකිව යුතු නිර්නාමික ගිණුම් පිළිබඳ තොරතුරු හෙළි කරන ලෙස අන්තර්ජාල අතරමැදියන්ට බල කිරීම සඳහා කොමිෂන් සභාවට මහේස්ත්‍රාත් අධිකරණයෙන් අධිකරණ නියෝගයක් ලබා ගත හැකිය.


## 8. පැමිණිල්ලක් නොමැතිව කොමිෂන් සභාවට ක්‍රියාමාර්ග ගත හැකිද?

ඔව්, තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කර ඇති බව කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, එයට තමන්ගේම මූලිකත්වයෙන් විමර්ශන ආරම්භ කළ හැකිය.

## 9. තහනම් ප්‍රකාශ අධිකරණයට අභියාචනා කළ හැකිද?

ඔව්, යම් තැනැත්තෙකුට කොමිෂන් සභාව විසින් ගන්නා ලද නිවේදන හෝ සීමා කිරීම් වැනි ක්‍රියාමාර්ග අභියෝගයට ලක් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම් කළ හැකිය.





05

# ප්‍රකාශිත මාර්ගගත ස්ථානය, ව්‍යාජ මාර්ගගත ගිණුම් සහ සමායෝජිත ව්‍යාජ හැසිරීම

## 1. “බොට්” එකක් යනු කුමක්ද සහ “බොට් ගිණුමක්” යනු කුමක්ද?

“බොට්” යන්නෙන්, ස්වයංක්‍රීය කටයුතු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සාදන ලද හෝ වෙනස් කරන ලද පරිගණක වැඩසටහනක් අදහස් වේ. බොට් ගිණුමක් මෙම පනත යටතේ අර්ථ දක්වා නැත, එය බොට් එකක් විසින් නිර්මාණය කරන ලද හෝ වෙනස් කරන ලද ගිණුමක් ලෙස තේරුම් ගත හැකිය.

## 2. ව්‍යාජ මාර්ගගත ගිණුමක් යනු කුමක්ද?

හිමිකරු නොවන පුද්ගලයෙකු පාලනය කරන, නමුත් පරිශීලකයා, ඊට අනන්‍ය වූ හඳුනා ගැනීමේ නාමය හෝ වෙනත් තොරතුරක් මඟින් හිමිකරු වශයෙන් පෙනී සිටින ගිණුමකි. මෙවැනි පෙනී සිටීමක් ශ්‍රී ලංකාවේ අන්තර්ජාල අවසාන පරිශීලකයන්ව නොමඟ යැවීමට භාවිත කළ හැක.

## 3. පනත සමායෝජිත “ව්‍යාජ හැසිරීම” නිර්වචනය කරන්නේ කෙසේද?

පනතේ අර්ථයට අනුව “සමායෝජිත ව්‍යාජ හැසිරීම” යනු ශ්‍රී ලංකාවේ ඕනෑම අන්තර්ජාල අතරමැදි සේවාවක අවසන් පරිශීලකයින් නොමඟ යැවීම සඳහා මාර්ගගත ගිණුම් දෙකක් හෝ වැඩි ගණනක් භාවිතා කරමින් සිදුකරන ඕනෑම සමායෝජිත ක්‍රියාවක් වේ. එකම තැනැත්තෙකු විසින් විවිධ ගිණුම් පාලනය කරන අවස්ථා සහ “ව්‍යාජ මාර්ගගත ගිණුමක්” නොවන හෝ බොට් මඟින් පාලනය නොවන මාර්ගගත ගිණුම් භාවිත කරමින් සිදු කරනු ලබන ක්‍රියාවක් ඊට ඇතුළත් නොවේ.

සාමාන්‍ය ව්‍යවහාරයේදී, එය මහජන කතිකාව හැසිරවීම හෝ හානිකර අන්තර්ගතයන් වැඩි කර දැක්වීම හෝ අසත්‍ය ආඛ්‍යාන පතුරුවා හැරීම හෝ චේතනාන්විතව මහජනයා රවටා ගැනීම සඳහා බොහෝ ව්‍යාජ ගිණුම් සංවිධානාත්මකව භාවිතා කිරීම ලෙස ප්‍රකාශ කළ හැකිය.

උදාහරණ ලෙස නොමඟ යවන අන්තර්ගතයන් සහිත ස්පෑම් යැවීම හෝ ව්‍යාජ සම්බන්ධතා හරහා පළ කිරීම් වල ජනප්‍රියතාවය පුම්බා දැක්වීම ඇතුළත් වේ.

## 4. ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක් යනු කුමක්ද, එය හඳුනා ගන්නේ කෙසේද?

මාර්ගගත ස්ථානයක් පහත නිර්ණායක සපුරාලන්නේ නම් එය ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක් ලෙස අදහස් වේ.

- එය මාස හයක් තුළ අවම වශයෙන් වෙනස් තහනම් ප්‍රකාශ තුනක් සන්නිවේදනය කර තිබිය යුතුය.
- මෙම ප්‍රකාශ තහනම් බවට අධිකරණ නියෝගවලට යටත් විය යුතුය.

ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන කොමිෂන් සභාව විසින් සලකුණු කරනු ලබන අතර, මහජනයාට දැනුම් දීම සඳහා දැන්වීම් නිකුත් කරනු ලැබේ.

## 5. ව්‍යාජ ගිණුම් හෝ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියාමාර්ග අතර;

- ව්‍යාජ ගිණුම් හෝ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන වෙත ප්‍රවේශය අවහිර කිරීමට අන්තර්ජාල අතරමැදියන්ට නියෝග කිරීම.
- ශ්‍රී ලංකාවේ සිටින පරිශීලකයින්ට විශේෂිත ගිණුම්වලට සම්බන්ධ වීමට ඉඩ නොදීම.
- ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන ගැන පරිශීලකයින්ට අනතුරු ඇඟවීම සඳහා දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.
- ප්‍රවේශය අක්‍රීය කිරීම හෝ අන්තර්ගතය ඉවත් කිරීම ඇතුළුව අමතර සීමාවන් පැනවීමට අධිකරණයට අයදුම් කිරීම.

## 6. තහනම් අරමුණු සඳහා බොට් නිර්මාණය කිරීම හෝ වෙනස් කිරීම සඳහා  සඳහා වන දඬුවම් මොනවාද?

පහත සඳහන් දෑ සඳහා බොට් නිර්මාණය කිරීම, වෙනස් කිරීම හෝ භාවිතා කිරීම සඳහා දඬුවම් තිබේ, නමුත් එය;

- සන්නිවේදනය කිරීම, හෝ
- වෙනත් පුද්ගලයෙකුට සන්නිවේදනය කිරීමට හැකියාව ලබා දීම,

එය චේතනාවෙන් සිදු කරන්නේ පමණි නම් මෙම පනත යටතේ වරදක් වේ.

මෙම වරදට වසර පහක් දක්වා සිර දඬුවම් හෝ රුපියල් ලක්ෂ පහක් දක්වා දඩයක් හෝ ඒ දෙකම ඇතුළත් වේ.

## 7. ප්‍රකාශිත මාර්ගගත ස්ථාන සඳහා අරමුදල් සපයන පුද්ගලයින්ට දඬුවම් අදාළ කළ හැකිද?


ඔව්, ප්‍රකාශිත මාර්ගගත ස්ථාන හෝ ඒවායේ අන්තර්ගතයන් ප්‍රවර්ධනය කිරීමට මූල්‍යමය සහාය ලබා දෙන ඕනෑම අයෙකුට වසර පහක් දක්වා සිර දඬුවම්, රුපියල් මිලියන පහක් දක්වා දඩ සහ අදාළ ඕනෑම වත්කමක් රාජසන්තක කිරීමේ දඬුවම්වලට යටත් විය හැකිය.

## 8. ප්‍රකාශිත මාර්ගගත ස්ථාන නැවත පිහිටුවිය හැකිද?

ඔව්, කොමිෂන් සභාවට මාර්ගගත ස්ථානයක ප්‍රකාශිත තත්ත්වය පහත සඳහන් කරුණු මත අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හැකිය:

- කොන්දේසි සතුටුදායක ලෙස පිළිපැදීම.
- නීත්‍යානුකූල භාවිතයන්ට අනුකූල බව පෙන්නුම් කරන හිමිකරුගේ හෝ ක්‍රියාකරුගේ අයදුම්පතක් මත.





06

# වැරදි විමර්ශනය කිරීම

## 1. පනත යටතේ වැරදි විමර්ශනය කිරීමේ වගකීම ඇත්තේ කාටද?

පනත යටතේ වැරදි විමර්ශනය කිරීමේ මූලික වගකීම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවට පැවරේ. ඊට අමතරව, විමර්ශන ක්‍රියාවලියට සහාය වීම සඳහා විශේෂඥයින් පත් කළ හැකිය. කොමිෂන් සභාවට පොලිසියේ සහාය ද ලබා ගත හැකිය.

## 2. කොමිෂන් සභාවට ඇති විමර්ශන බලතල මොනවාද?

කොමිෂන් සභාවට පහත සඳහන් බලතල ඇත:

- චෝදනා ලද උල්ලංඝනයන් පිළිබඳ විමර්ශන පැවැත්වීම.
- අන්තර්ජාල අතරමැදියන්, පුද්ගලයන් හෝ සංවිධානවලින් තොරතුරු ඉල්ලා දැන්වීම් නිකුත් කිරීම.
- විමර්ශන සඳහා පොලිසියේ සහාය ලබා ගැනීම.
- සාමාන්‍යයෙන් මේ පනත යටතේ වන එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම සඳහා අවස්ථානුගත හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

## 3. විමර්ශන සඳහා සහාය වීමට විශේෂඥයින් පත් කළ හැකිද?

ඔව්, අධිකරණ විෂය පවරා ඇති අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර (පනතේ විධිවිධාන පරිපාලනය කිරීමේ කාර්යය පවරා ඇති) අමාත්‍යවරයාට,  වැරදි විමර්ශනය කිරීමේදී කොමිෂන් සභාවට සහාය වීම සඳහා විශේෂඥයින් පත් කළ හැකිය. මෙම විශේෂඥයින්ට ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ශිල්පය හෝ මෘදුකාංග තාක්ෂණය පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු අතර ඔවුන් පහත සඳහන් තැනැත්තන් විය හැකිය:

- රජයේ නිළධාරියෙකු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ආණ්ඩුවේ සමාගමක සේවා නියුක්තයකු.
- නියමිත සුදුසුකම් ඇති සහ අදාළ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයෙකු.
- අවශ්‍ය විශේෂඥතාව ඇති බවට අදාළ විශ්වවිද්‍යාලය විසින් පිළිගනු ලබන රාජ්‍ය ආයතන.

මෙම විශේෂඥයින්ට ඩිජිටල් සාක්ෂි විශ්ලේෂණය කිරීම, මාර්ගගත වැරදි හඳුනා ගැනීම වැනි විවිධ අංශවලින් කොමිෂන් සභාවට සහාය විය හැකිය.

## 4. සෝදිසි කිරීමේ සහ තහනමට ගැනීමේ බලතල තිබේද?

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ, වන වරදක් සම්බන්ධයෙන් වන විමර්ශනයක් සඳහා පොලිස් නිලධරයකුට සහාය වන විශේෂඥයකු විසින්, ඒ පොලිස් නිලධරයා විසින් ඒ කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, තත් කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන වරෙන්තුවක බලය යටතේ-

- යම් අන්තර්ජාල සේවා සපයන්නකු සන්තකයේ ඇති, දායකවන්නන් පිළිබඳ තොරතුරු සහ හුවමාරු වන දත්ත ඇතුළු යම් තොරතුරක් ලබා ගැනීමට හෝ

දායකවන්නන් පිළිබඳ තොරතුරු සහ හුවමාරු වන දත්ත ඇතුළු යම් රැහැන් හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයකට, ඒ සන්නිවේදනයේ කවර හෝ අවස්ථාවක දී බාධා කිරීම, කරනු ලැබිය හැකි ය. විමර්ශනයක කාර්ය සඳහා, හුවමාරු වන දත්ත ඇතුළු දත්ත සහ තොරතුරු රඳවා තබා ගන්නා ආකාරය සහ බාධා කරන ආකාරය සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය,
අමාත්‍යවරයා විසින්, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ය.



07

# අන්තර්ජාල අතරමැදියන්ගේ වගකීම

## 1. "අන්තර්ජාල අතරමැදියෙක්" / "අන්තර්ජාල අතරමැදි සේවාවක්" යනු කුමක්ද?

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ "අන්තර්ජාල අතරමැදියා" යනු අන්තර්ජාල අතරමැදි සේවාවක් සපයන තැනැත්තාය. අන්තර්ජාල අතරමැදි සේවාවක් යනු පරිශීලකයින්ට අන්තර්ජාලයේ තෙවන පාර්ශවයන්ගෙන් අන්තර්ගතයට ප්‍රවේශ වීමට, සම්ප්‍රේෂණය කිරීමට හෝ සොයා ගැනීමට උපකාර වන ඕනෑම සේවාවකි. ඒ සඳහා  පහත සඳහන් දෑ ඇතුළත් වේ:


1. අන්තර්ජාලය තුළ හෝ අන්තර්ජාලය මගින් තුන්වන පාර්ශ්වයන්ගෙන් උත්පාදනය වන දේ සඳහා ප්‍රවේශ වීම පිණිස අවසාන පරිශීලකයන් හට ඉඩ ලබා දෙන සේවාවක් උදාහරණ: ෆේස්බුක්, යූ ටියුබ්, ඉන්ස්ටග්‍රෑම්.

2. පරිශීලකයින් අතර දේවල් සම්ප්‍රේෂණය කිරීමේ සේවාවක් උදාහරණ: වට්ස්ඇප්, වයිබර්, ජීමේල්

3. බාහිර අන්තර්ගතයන්ට සම්බන්ධ සෙවුම් ප්‍රතිඵල පෙන්වන සෙවුම් යන්ත්‍ර. උදාහරණ: Google Search, Bing.

4. වෙළඳ ප්‍රචාරයකින් සහ සේවා සපයන්නන් අතර වන සබැඳිය හෝ සබැඳියේ කොටසක් ලෙස කටයුතු කිරීමෙන් යම් ස්ථානයක ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයන්  සන්නිවේදනය කිරීම සඳහා පහසුකම් සලසන සේවා උදාහරණ: Google Ads, Facebook Ads.

කෙසේවෙතත්, ඊට මහජනයාට අන්තර්ජාලය වෙත ප්‍රවේශය හෝ පරිගණක සම්පත් සේවා ඇතුළත් නොවේ.



## 2. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳපනත  පනත "අන්තර්ජාල සේවා සපයන්නා" නිර්වචනය කරන්නේ කෙසේද?

අන්තර්ජාල සේවා සපයන්නා යනු 1991 අංක 25 දරන විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ සේවා සපයන්නන් ද ඇතුළුව, යවනු ලබන හෝ ලබා ගන්නා දෙයෙහි අන්තර්ගතය වෙනස් කිරීමෙන් තොරව, පරිශීලකයා විසින් තෝරාගනු ලබන දේ, පරිශීලකයා විසින් නිශ්චිතව දක්වනු ලබන ස්ථාන අතර හෝ ඒ අන්තරයෙහි සම්ප්‍රේෂණය කිරීම සහ ගමන් කරවීම සිදු කරන හෝ ඩිජිටල් මාර්ගගත සන්නිවේදනය සඳහා සබඳතා සපයන යම් අස්ථිත්වයක් අදහස් වේ.

## 3. අන්තර්ජාල අතරමැදි සේවාවක් අන්තර්ජාල සේවා සපයන්නෙකුගෙන් වෙනස් වන්නේ කෙසේද?

අන්තර්ජාල අතරමැදියා: අන්තර්ජාලයේ තෙවන පාර්ශවීය අන්තර්ගතයට ප්‍රවේශ වීමට, සම්ප්‍රේෂණය කිරීමට හෝ සොයා ගැනීමට පහසුකම් සපයයි. මෙයට සමාජ මාධ්‍ය, සෙවුම් යන්ත්‍ර සහ මාර්ගගත වෙළඳ ප්‍රචාරණ සේවා වැනි වේදිකා ඇතුළත් වේ. ඔවුන් පරිශීලකයන් විසින් ජනනය කරන ලද අන්තර්ගතයන් සමඟ සම්බන්ධ වුවද සැබෑ අන්තර්ජාල සම්බන්ධතාවය සපයන්නේ නැත. උදාහරණ: ෆේස්බුක්, එක්ස් (පෙර ට්විටර් ලෙස හඳුන්වනු ලැබූ) වැනි සමාජ මාධ්‍ය වේදිකා සහ වට්ස්ඇප් වැනි පණිවිඩකරණ වේදිකා.

අන්තර්ජාල සේවා සපයන්නා : අන්තර්ජාල ප්‍රවේශය සඳහා භෞතික හා තාක්ෂණික යටිතල පහසුකම් සපයයි. උදාහරණ: ඩයලොග් සහ මොබිටෙල් වැනි විදුලි සංදේශ ක්‍රියාකරුවන්.

ප්‍රධාන වෙනස: අන්තර්ජාල සේවා සපයන්නන් සම්බන්ධතාවය ලබා දීමෙන් පරිශීලකයින් අන්තර්ජාලයට සම්බන්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, අන්තර්ජාල අතරමැදියන් මාර්ගගත අන්තර්ගතයට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කරයි.

## 4. පනත යටතේ අන්තර්ජාල අතරමැදියන්ගේ කාර්යභාරය කුමක්ද?

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ අන්තර්ජාල අතරමැදියන් තම සේවා තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීම සඳහා භාවිතා නොකිරීමට සාධාරණ පියවර ගත යුතු අතර මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවේ නියෝගවලට අනුකූල විය යුතුය.

## 5. අන්තර්ජාල අතරමැදියන් තම වේදිකාවල බෙදා ගන්නා අන්තර්ගතයන් සඳහා ස්වයංක්‍රීයව වගකිව යුතුද?

අන්තර්ජාල අතරමැදි සේවා, අන්තර්ජාල සේවා සපයන්නන්, පරිගණක සම්පත් සේවා ආදිය පහත සඳහන් අවස්ථා වලදී ස්වයංක්‍රීයව වගකිව යුතු නොවේ:

- තහනම් අන්තර්ගතයන් ආරම්භ කිරීම, වෙනස් කිරීම හෝ ලබන්නා තේරීම සිදු නොකළ අවස්ථාවලදී.
- කොමිෂන් සභාවෙන් හෝ අධිකරණයකින් දැනුම් දීමක් ලැබුණු විට තහනම් අන්තර්ගතයන් කඩිනමින් ඉවත් කළ අවස්ථාවලදී.
- පනතේ විධිවිධාන, ඒ යටතේ සකස් කරන ලද රීති සහ රෙගුලාසි හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ඕනෑම චර්යාධර්ම සංග්‍රහයකට අනුකූල වූ අවස්ථාවලදී.

## 6. අනුකූල නොවීම සඳහා වූ අන්තර්ජාල අතරමැදියෙකුගේ වගකීම කුමක්ද?

- තහනම් ප්‍රකාශ සංසරණය වීම වැළැක්වීම සඳහා අධිකරණ නියෝගයක් සඳහා අයදුම් කිරීම.

තහනම් අන්තර්ගතයන් ඉවත් කිරීමට හෝ ප්‍රවේශය අක්‍රීය කිරීමට අධිකරණ නියෝගයකට අන්තර්ජාල අතරමැදියෙකු අනුකූල වීමට අපොහොසත් වුවහොත්, ඔවුන් රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට යටත් වේ.

- ප්‍රකාශ කරන ලද මාර්ගගත ස්ථාන සම්බන්ධ අපරාධ.

අන්තර්ජාල අතරමැදියෙකු "ප්‍රකාශ කරන ලද මාර්ගගත ස්ථානයක්" සම්බන්ධයෙන් සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වන අවස්ථාවකදී, ඔවුන් වසර හතකට නොවැඩි කාලයක් සඳහා සිර දඬුවම් හෝ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයක් සහිත වරදක් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු විය හැකිය. එම වරද දෙවන වරටත් සිදු කර ඇත්නම්, දඬුවම දෙගුණ විය හැකිය.

## 7. අතරමැදියන්ට පරිශීලක අනන්‍යතා හෙළි කිරීමට අවශ්‍ය විය හැකිද?

ඔව්. පරිශීලක අනන්‍යතා ඇතුළුව තොරතුරු හෙළි කිරීමට ඔවුන්ට අවශ්‍ය විය හැකිය.

විමර්ශනයක් සඳහා පරිශීලකයෙකු හඳුනා ගැනීම අවශ්‍ය බව අධිකරණයක් තීරණය කරන්නේ නම්, IP ලිපින, ගිණුම් විස්තර සහ වෙනත් හඳුනාගැනීම් ඇතුළුව පරිශීලක තොරතුරු සැපයීමට අතරමැදියන්ට බල කළ හැකිය.

## 8. හෙළි කිරීමට හෝ බාධා කිරීමට බල කළ හැකි වෙනත් තොරතුරු මොනවාද?

විමර්ශනයක් සඳහා පොලිස් නිලධරයකුට සහාය වන විශේෂඥයකු විසින්, ඒ පොලිස් නිලධරයා විසින් ඒ කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, තත් කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන වරෙන්තුවක බලය යටතේ-

- යම් අන්තර්ජාල සේවා සපයන්නකු සන්තකයේ ඇති, දායකවන්නන් පිළිබඳ තොරතුරු සහ හුවමාරු වන දත්ත ඇතුළු යම් තොරතුරක් ලබා ගැනීමත හෝ
- දායකවන්නන් පිළිබඳ තොරතුරු සහ හුවමාරු වන දත්ත ඇතුළු යම් රැහැන් හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයකට, ඒ සන්නිවේදනයේ කවර හෝ අවස්ථාවක දී බාධා කිරීම, කරනු ලැබිය හැකි ය.

## 9. ප්‍රකාශිත ස්ථාන සම්බන්ධයෙන් අන්තර්ජාල අතරමැදියන්ගේ බැඳීම් මොනවාද?

අතරමැදියන් පහත සඳහන් දෑ කළ යුතුය:

- ප්‍රකාශිත මාර්ගගත ස්ථානවලින් තහනම් අන්තර්ගතයන් ශ්‍රී ලංකාව තුළ සන්නිවේදනය නොකිරීමට සාධාරණ පියවර ගැනීම.
- මෙම වේදිකා සමඟ සම්බන්ධ ඕනෑම ගෙවන ප්‍රවර්ධනයක් හෝ දැන්වීම් වැළැක්වීම.

08

# අන්තර්ජාල අතරමැදියන්ගේ වගකීම

## 1. "අන්තර්ජාල අතරමැදියෙක්" / "අන්තර්ජාල අතරමැදි සේවාවක්" යනු කුමක්ද?

වගකීම පහත සඳහන් තැනැත්තන්ට පැවරේ:

- තහනම් ප්‍රකාශ නිර්මාණය කරන හෝ පතුරුවන, බොට් ගිණුම් ක්‍රියාත්මක කරන හෝ අව්‍යාජ නොවන මාර්ගගත හැසිරීම්වල නිරත වන පුද්ගලයින්.
- අව්‍යාජ නොවන ක්‍රියාකාරකම් හෝ තහනම් ප්‍රකාශ සඳහා පහසුකම් සපයන හෝ දිරිමත් කරන සංවිධාන.
- කොමිෂන් සභාවේ නියෝගවලට අනුකූල වීමට අපොහොසත් වන අන්තර්ජාල අතරමැදියන්/ අන්තර්ජාල සේවා සපයන්නන්

## 2. සමාගම් අධ්‍යක්ෂවරුන් පෞද්ගලිකව වගකිව යුතුද?

ඔව්. සමාගමක් වරදක් කරන්නේ නම්, එහි අධ්‍යක්ෂවරුන්ට, හවුල්කරුවන්ට හෝ ප්‍රධාන නිලධාරීන්ට පහත සඳහන් කරුණු ඔප්පු කිරීමට නොහැකි නම්, අපරාධමය වශයෙන් වගකිව යුතු විය හැකි බව පනතේ සඳහන් වේ:

- ඔවුන්ට වරද ගැන දැනුමක් නොතිබුණි.
- එය වැළැක්වීම සඳහා ඔවුන් සාධාරණ පියවර/ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීම.

## 3. පනත උල්ලංඝනය කිරීම සඳහා වන දඬුවම් මොනවාද?

දඬුවම් වරද අනුව වෙනස් විය හැකි නමුත් පහත සඳහන් දෑ ඇතුළත් විය හැකිය:

- සිර දඬුවම්
- දඩ නියම කිරීම.
- ව්‍යාපාර සීමා කිරීම්: සමාගම් ශ්‍රී ලංකාවේ මෙහෙයුම් තහනමකට යටත් විය හැකිය.

## 4. ප්‍රකාශිත මාර්ගගත ස්ථානයක් අධිකරණ නියෝගයකට අනුකූල වීමට අපොහොසත් වුවහොත් කුමක් සිදුවේද?

අනුකූල වීමට අපොහොසත් වීමෙන් පහත ප්‍රතිඵල ලැබිය හැක:


- ක්‍රියාකරුවන් සඳහා වසර හයක් දක්වා සිර දඬුවම්.
- රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයක්.
- ශ්‍රී ලංකාවේ සිටින පරිශීලකයින් සඳහා සම්පූර්ණ ප්‍රවේශය අක්‍රිය කිරීම.

## 5. පනත යටතේ වරදක් කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන්ට දඬුවම් කළ හැකිද?

ඔව්. පනත යටතේ වරදක් කිරීමට තැත් කිරීම සිර දඬුවම්, දඩ හෝ ඒ දෙකෙන්ම දඬුවම් ලැබිය හැකිය. සිර දඬුවම නියම කර ඇති උපරිම කාල සීමාවේ භාගයක් වන අතර දඩය ද උපරිම දඩයෙන් හරි අඩක් නොඉක්මවන දඩයකට ක් විය යුතුය.

## 6. වරදක් කිරීමට අනුබල දීම හෝ කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන්ට දඬුවම් කළ හැකිද?

ඔව්. පනත යටතේ වරදක් කිරීමට අනුබල දීම/ ආධාර කිරීම හෝ කුමන්ත්‍රණය කිරීම එම වරදම කිරීම සඳහා නියම කර ඇති දඬුවම්වලට යටත් වේ.




09

# විවිධ කරුණු

## 1. මෙම පනත යටතේ පුද්ගලයෙකු දෙවන වරට වරදකරුවෙකු වුවහොත් කුමක් සිදුවේද?

පුද්ගලයෙකු දෙවන වරට වරදකරුවෙකු වුවහොත්, දඩ මුදල් සහ සිර දඬුවම් කාලය දෙගුණ කළ හැකිය.

## 2. මෙම පනත යටතේ සිදු කරන ලද වැරදි සඳහා සංවිධාන වගකිව යුතු වේද? ඔවුන් වගකිව යුතු නොවන අවස්ථා තිබේද?

ඔව්. සංවිධානයක් (සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවූ) පනත යටතේ වරදක් කරන්නේ නම්, එහි අධ්‍යක්ෂවරුන්ට, හවුල්කරුවන්ට හෝ ප්‍රධාන නිලධාරීන්ට පහත සඳහන් කරුණු ඔප්පු කිරීමට නොහැකි නම්, අපරාධමය වශයෙන් වගකිව යුතු විය හැකිය:

- ඔවුන්ට වරද ගැන දැනුමක් නොතිබුණි.
- එය වැළැක්වීම සඳහා ඔවුන් සාධාරණ පියවර ගෙන තිබේ.

## 3. පනත උල්ලංඝනය කරන මාර්ගගත අන්තර්ගතයන්ට කුමක් සිදුවේද?

එමඟින් පහත සඳහන් දෑ කිරීමට නියෝග කළ හැකිය-

- වරදකාරී අන්තර්ගතය ඉවත් කිරීම.
- උල්ලංඝනය කිරීම් සඳහා වගකිව යුතු වෙබ් අඩවි හෝ මාර්ගගත ගිණුම් වෙත ප්‍රවේශය අවහිර කිරීම.
- තහනම් ප්‍රකාශ තවදුරටත් බෙදා හැරීම සීමා කිරීම.

එවැනි නියෝගවලට අනුකූල වීමට අපොහොසත් වීමෙන් වැඩි දඬුවම් ලැබිය හැකිය.

## 4. පනත යටතේ ඇති රෙගුලාසි වෙනස් කළ හැකිද?

ඔව්, අමාත්‍යවරයාට පනතේ විධිවිධාන වෙනස් කිරීමට හෝ පුළුල් කිරීමට රෙගුලාසි සෑදීමේ බලය ඇත. මෙම රෙගුලාසි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

## 5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත කුමක් සිදුවේද?

එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. ඉංග්‍රීසි පාඨය පිළිබඳ කිසිදු සඳහනක් නොමැති බව සැලකිල්ලට ගත යුතුය.



## 2 වන පරිච්ඡේදය

# 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සම්බන්ධයෙන් වූ විවේචනාත්මක සමාලෝචනයක්

පර්යේෂණය කළේ:

**ස්ලීෂා ද සිල්වා**

M.A in Human Rights and Multiculturalism (Pera),
LLB (Hons) (UK)

*සමාලෝචනය කළේ:

තාක්ෂණ, මාධ්‍යය සහ විද්‍යුත් සන්නිවේදන නීති
පිළිබඳ නීති උපදේශක | පර්යේෂක

**අශ්විනි නටේසන්**



*භාෂාව, අනුකූලතාව සහ පැහැදිලි බව සඳහා සමාලෝචනය කරන ලදී. ප්‍රකාශිත අදහස් පර්යේෂකයාගේ අදහස් වේ.

ශ්‍රී ලංකාවේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (OSA) බලාත්මක වී වසරකට පසුවත්, එහි විධිවිධාන සහ සන්දර්භය තුළ ඇති ගැටළු කිහිපයක් හේතුවෙන්, එහි අර්ථ දැක්වීම් නොපැහැදිලි වීම, මාර්ගගත ප්‍රකාශන අපරාධකරණය කිරීම, අධිකරණ අධීක්ෂණයක් නොමැතිකම සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් අනුගමනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් විය මානව හිමිකම්, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ පෞද්ගලිකත්වයට දැඩි තර්ජනයක් ලෙස පවතී. ගෝලීය ජාල මුලපිරීම (2024) පෙන්වා දෙන්නේ, පාර්ලිමේන්තුව තුළ පනත සම්මත කිරීමට අදාළ සියලු කටයුතු ඉතා කඩිනමින් සිදුවූ නිසා විපක්ෂ මන්ත්‍රීවරු පවා අවසන් විවාදය වහනෙක්ම එහි ප්‍රධාන විධිවිධාන පවා නොදැන සිටි බවයි. ඔවුන්ගෙන් ඊට ප්‍රමාණවත් තරමින් බලපෑම් ඉදිරිපත් වූයේ පනත සම්මත වීමට දිනකට පෙරදිය. ශ්‍රී ලංකා රජය, කාන්තාවන් සහ දරුවන් ආරක්ෂා කිරීමේ අරමුණින් පනවන නීතියක් ලෙස මෙය සම්පාදනය කළ බව ප්‍රකාශ වුවද, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) එමගින් අපේක්ෂිත පුමුඛ අරමුණු සපුරාලනු වෙනුවට වාරණය, වඩාත් සුපරික්ෂාකාරී නිරීක්ෂණය සහ අධිපතිවාදී පාලනයට ඉඩ සළසයි. එහි පුළුල් විෂය පථය තුළ මාධ්‍යවේදීන් සහ ක්‍රියාකාරින්ගෙන් ඔබ්බට ව්‍යාපාරික ප්‍රධානීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරින්, ශාස්ත්‍රඥයින් සහ සමාජයේ ධනවත් පුද්ගලයින් දක්වා විහිදී තිබේ. පුළුල් විවේචන මධ්‍යයේ, රජය මේ වනවිට එම නීතිය සංශෝධනය කිරීමට සැලසුම් ප්‍රකාශයට පත් කර ඇතත්, මුල් පනතේ මූලික අඩුපාඩු තවදුරටත් එහි ප්‍රධාන දුර්වලතා ලෙස පවතී. (හත්තොටුව 2025a, හත්තොටුව 2025b)

හියුමන් රයිට්ස් වොච් (2024) සංවිධානය පවසන්නේ, මෙම පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී ඊට අදාළ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ කිසිඳු උපදේශනයක් නොමැති වීම බරපතල ගැටලුවක් වූ බවයි. සිවිල් සමාජ සංවිධාන, මාධ්‍ය නියෝජිතයින්, නීති විශාරදයින් සහ ඩිජිටල් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් වැනි මෙම පනතින් බලපෑමට ලක්වන පාර්ශ්වයන්ට වම ක්‍රියාවලියට සහභාගී වීමට ආරාධනා කරන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාදායක ක්‍රියාවලියක් නොවූවා පමණක් නොව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) සම්පාදනය වූයේ සංවෘත දොරවල්වලින් වැසුන පරිශ්‍රයන් තුළ බවද එම සංවිධානය වැඩිදුරටත් පෙන්වා දෙයි. (FT2024, Hattotuwa 2025a) විනිවිද භාවයක් නොමැති මෙම ක්‍රියාවලිය මහජන විශ්වාසය දැඩි ලෙස පළුදු කළා පමණක් නොව, ඩිජිටල් පාලනය, මානව හිමිකම් ආරක්ෂාව සහ තාක්ෂණික දියුණුවේ යථාර්ථයන් සඳහා වගකීමට අපොහොසත් වන පළුදු සහිත දුර්වල නීතියකට ද හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වීම නීතිය සැබෑ මාර්ගගත ආරක්ෂක පියවරයකට වඩා රාජ්‍ය පාලනය කෙරෙහි ප්‍රමුඛත්වය දෙන, පරිශීලකයින් මාර්ගගත හානිවලින් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයකට වඩා වාරණය සඳහා 'මොට මෙවලමක්' ලෙස ක්‍රියාකරයි. (HRW 2024)

සංජන හත්තොටුව (2025) දක්වා සිටිනුයේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනතට (OSA) අනපේක්ෂිත විවේචන රැල්ලකට මුහුණදීමට සිදු වූ අතර විශේෂයෙන්ම මෘදුකාංග සංවර්ධනය, සමාජ මාධ්‍ය, කෘතිම බුද්ධිය (AI) සහ එකම තොරතුරු අවකාශ කිහිපයක ගබඩා කර තැබීම (cloud computing) ඇතුළු පරිගණක ජාලා සම්බන්ධව කටයුතු කරන ලොව ප්‍රමුඛ පෙළේ තාක්‍ෂණ සමාගම් රැසක එකමුතුවෙන් සැදුම්ලත් ආසියානු අන්තර්ජාල එකමුතුව (AIC) ඒ අතරින් ප්‍රමුඛ වූ බවය. (හත්තොටුව 2025a) පනතේ ඩිජිටල් අයිතිවාසිකම්, ව්‍යාපාර මෙහෙයුම් සහ අනුකූලතා රාමුවල බලපෑම හඳුනාගත් ආසියානු අන්තර්ජාල එකමුතුව (AIC), ඒ පිළිබඳ නීතියෙන් එල්ලවන අන්තරායන් සම්බන්ධයෙන් අනතුරු අඟවමින් ප්‍රකාශ කිහිපයක්ම නිකුත් කළේය. මෙම දැඩි පීඩනය හේතුවෙන් ශ්‍රී ලංකා රජයට ගැටලු විසඳීම සඳහා 2024 අගෝස්තු මාසයේදී සංශෝධන හඳුන්වා දීමට සිදුවිය. (Hattotuwa 2025a) කෙසේ වෙතත්, නීතිය වැඩිදියුණු කිරීමට වඩා, මෙම සංශෝධන මගින් ඇතැම් අංශවල පැවැති තත්ත්වය තවත් නරක අතට හැරවූ අතර අවසානයේ පුද්ගල අයිතිවාසිකම්, ප්‍රකාශනයේ නිදහස සහ පෞද්ගලිකත්වයට එල්ල වන මූලික තර්ජන ආමන්ත්‍රණය නොකර එම සංශෝධන කර්මාන්ත අවශ්‍යතා ආරක්ෂා කිරීමට සීමාවීය. (හත්තොටුව 2025a, හත්තොටුව 2025b)

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), 2024 පෙන්වා දෙන්නේ, සංශෝධන හරහා පවා නිවැරදි කර නොමැති මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතේ ප්‍රධාන අඩුපාඩුවක් වූ 14 වන වගන්තියේ සඳහන් "ද්වේෂ සහගතව" සහ "නිකරුණේ" යන ප්‍රධාන නීතිමය පද නිර්වචනය කිරීමට අපොහොසත් වීමයි. (FT 2024) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත මගින් අසත්‍ය තොරතුරු බෙදා හැරීම/ සන්නිවේදනය වරදක් ලෙස සලකන නමුත්, අසත්‍ය දේ හෝ ඒ සම්බන්ධයෙන් වූ චේතනාව විනිශ්චය කරන්නේ කෙසේද යන්න පිළිබඳ පුළුල් අර්ථ දැක්වීමක් සහිතව, නීතිය හානිකර ලෙස පුළුල්කර ඇති බවද, එය අත්තනෝමතික ලෙස බලාත්මක කිරීමට විවෘතව පවත්නා බවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තව දුරටත් පෙන්වා දෙයි. (හත්තොටුව 2025a, හත්තොටුව 2025b) අපැහැදිලි බව දැවන්ත නීතිමය අවිනිශ්චිතතාවයක් ඇති කරන අතර, බලධාරීන්ට, මාධ්‍යවේදීන්, ක්‍රියාකාරීන් සහ විවේචකයින්ට එරෙහිව නීතිය අවියක් ලෙස භාවිත කිරීමට පහසු කරවන අතර, දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත පටු දේශපාලන අරමුණු සඳහා නඩු පැවරීම් වලටද ඉඩ සලසයි.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) ශ්‍රී ලංකාවේ මූලික මානව අයිතිවාසිකම්, ප්‍රකාශනයේ නිදහස සහ ඩිජිටල් පෞද්ගලිකත්වයට තර්ජනයක් වන දැඩි දෝෂ සහිත සහ පීඩාකාරි නීති සම්පාදනයක් ලෙස පවතී. (හත්තොටුව 2025a, හත්තොටුව 2025b) ඉතා හදිසියේ සහ විනිවිද භාවයෙන් තොර ක්‍රියාවලියක් හරහා බලාත්මක කරන ලද එහි නොපැහැදිලි විධිවිධාන සහ පරික්ෂා නොකළ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් වාරණය, පුළුල් නිරීක්ෂණ (mass surveillance) සහ අධිකාරි බලයක් සහිත පාලනය සඳහා මග පෑදි ඇත. (FT 2024) රජය පනත සංශෝධනය කිරීමට සැලසුම් ප්‍රකාශයට පත් කර ඇතත්, එහි මූලික අඩුපාඩු විසඳීමට හුදෙක් සංශෝධන පමණක් ප්‍රමාණවත් නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සහ ව්‍යවස්ථාමය ආරක්ෂාවන් යටපත් නොකර සැබෑ මාර්ගගත ආරක්ෂාව සහතික කිරීම සඳහා මෙම පනත සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම සහ/හෝ විනිවිද පෙනෙන, සියලු කරුණු වල සහභාගිත්වය ඇති (inclusive) සහ අයිතිවාසිකම්වලට ගරු කරන නීතිමය රාමුවකින් ප්‍රතිස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය බව Access Now සංවිධානය (2024) අවධාරණය කරයි.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) ශ්‍රී ලංකාවේ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) සමඟ සෘජුවම ගැටෙයි. (Hattotuwa 2024a ) ඒම පරස්පරතාව සුළුපටු නොවේ- එය මූලික වන අතර සහ අනුකූල කළ නොහැකි ය. PDPA නිර්මාණය කර ඇත්තේ පුද්ගලයන්ගේ පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා වන අතර, එය

ඩිජිටල් අවකාශයන්හි පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරයි (හත්තොටුව, 2024). ඊට ප්‍රතිවිරුද්ධව, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) බලධාරීන්ට මාර්ගගත අන්තර්ගතයන් නිරීක්ෂණය කිරීමට, වාරණය කිරීමට සහ ප්‍රවේශ වීමට පුළුල් බලතල ලබා දෙන අතර, පුද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් (PDPA) ආරක්ෂා කිරීමට උත්සාහ කරන අයිතිවාසිකම් එළදායි ලෙස එ මගින් ඉවත් කරයි.

මෙම ගැටුම න්‍යායාත්මක නොවන නමුත් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) හි විෂය පථය හා ප්‍රවේශය තුළ ගැඹුරින් කාවැදී ඇත. මෙම නීතිය ව්‍යුහගත කර ඇත්තේ ශ්‍රී ලංකාවේ දේශසීමාවලින් ඔබ්බට විහිදෙන ආකාරයට වන අතර, ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලාංකික පුරවැසියෙකුට එරෙහිව හානියක්/බලපෑමක් ඇති වුවහොත්, ලෝකයේ ඕනෑම තැනක සිටින සෑම පුද්ගලයෙකුටමද අදාළ වේ. (හත්තොටුව 2024a) එය අනාගත මාර්ගගත ක්‍රියාකාරකම් නියාමනය කිරීමට පමණක් නොව එමගින් පුද්ගලයෙකු විසින් ඔවුන්ගේ ජීවිත කාලය තුළ ඕනෑම අවස්ථාවක උඩුගත කරන ලද සියලුම ඩිජිටල් අන්තර්ගතයන් පසුකාලීනවද පාලනය කිරීමට හැකියාව ඇත. මෙයින් අදහස් කරන්නේ ඕනෑම මාර්ගගත සටහනක්, පණිවිඩයක් හෝ ලිපියක් - කොපමණ පැරණි වුවත් - එය අධිකරණ බලයට යටත් විය හැකි බවත්, මෙම නීතිය ගෙන වීමට පෙර උඩුගත කරන ලද අන්තර්ගතයන් සඳහාද අදාළ පුද්ගලයින් පරීක්ෂා කර දඬුවම් කිරීමට බලධාරීන්ට ඉඩ සලසන බවයි. තවද, පනත එහි බලාත්මක කිරීම සඳහා කාල සීමාවක් නියම නොකරන අතර, එමගින් පුද්ගලයින් සදාකාලික නිරීක්ෂණ සහ නියාමනයට යටත් කරයි.

ගෝලීය ජාල මුලපිරීම (2024) පෙන්වා දෙන මෙහි තවත් ගැටලුවක් වන්නේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාවට ලබා දී ඇති අසාමාන්‍ය මට්ටමේ බලයයි. (Hattotuwa 2025a) අධිකරණ අධීක්ෂණයකින් හෝ ස්වාධීන සමාලෝචන යාන්ත්‍රණයකින් තොරව, අන්තර්ගතය ඉවත් කිරීමට නියෝග කිරීමට, සම්පූර්ණ වේදිකා අවහිර කිරීමට සහ අපරාධ නඩු පැවරීමට මෙම පනත යටතේ කොමිෂන් සභාවට හැකියාවක් ඇත. කොමිෂන් සභාවේ තීරණ අධිකරණ සමාලෝචනයට යටත් වේ. එ නම් එහි නියෝග වලින් බලපෑමට ලක් වූ පුද්ගලයින්ට හෝ ආයතන වලට අධිකරණයේදී එහි ක්‍රියාවන්ට/ තීරණ වලට එරෙහිව අභියෝග කළ හැකිය. ඊට අමතරව, ව්‍යවස්ථාදායක සභාව කොමිනේ සභාවේ සාමාජිකයින් පත් කිරීමට සම්බන්ධ වන අතර, විමගින් මූලික අධීක්ෂණයක් ලබා දෙයි. එසේ තිබියදීත්, අන්තර්ගත ඉවත් කිරීම සහ වේදිකා අවහිර කිරීම වැනි තීරණ සඳහා අධිකරණ අනුමැතියක් නොමැතිකම, අත්තනෝමතික ලෙස බලාත්මක කිරීමට ඉඩ සලසන අතර, අධීක්ෂණයේ කාර්යක්ෂමතාව සීමා කරයි (ගෝලීය ජාල මුලපිරීම, 2024). මෙම නීතියේ නොපැහැදිලිකම සහ ඕනාවට වඩා පුළුල් විධිවිධාන සමඟ ඒකාබද්ධව, මෙම බල සංකේන්ද්‍රණය, අපයෝජනය සඳහා පරිසරයක් නිර්මාණය කරයි. එහිදී වාරණය තෝරා බේරා යෙදවීමක් සිදු විය හැකි අතර, එය මාධ්‍යවේදීන්ට, ක්‍රියාකාරීන්ට, විපක්ෂ පුද්ගලයින්ට සහ විරුද්ධ මත දරන්නන්ගේ හඬට අසමාන ලෙස බලපායි.

අවසාන වශයෙන්, සංශෝධන මගින් බලය අනිසි ලෙස භාවිතා කිරීම, අත්තනෝමතික වාරණය හෝ පෞද්ගලිකත්ව උල්ලංඝනයන්ට එරෙහිව අර්ථවත් ආරක්ෂාවක් ලබා නොදෙයි. ඒ වෙනුවට, සංශෝධන ප්‍රධාන වශයෙන් රජය සහ නීතිමය අංශ කර්මාන්තය ආරක්ෂා කිරීමට යට වන්දි ගෙවීමට නියම කරන අතර, තාක්ෂණික සමාගම් අනුකූලතා අසමත්වීම් සඳහා වගකිව යුතු නොවන බව සහතික කරයි.

මේ හේතුවෙන් පුද්ගලයින් නීතිමය සහ රාජ්‍ය සීමාවන්ට වඩා වැඩි අවදානමට ලක් විය හැකිය.

මෙම මූලික ගැටළු විසඳීමට අපොහොසත් වීමෙන් අදහස් වන්නේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත (OSA) ගැඹුරු දෝෂ සහිත හා පීඩාකාරී නීති සම්පාදනයක් ලෙස පවතින අතර, එය ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් සහ ඩිජිටල් අනාගතය දෙකම තර්ජනයට ලක් කරන්නේය. ඉදිරියට යාමේදී, නව නීති සම්පාදනයක්, අර්ථවත් පාර්ශව කරුවන්ගේ උපදේශනය, අධිකරණ අධීක්ෂණය සහ ජාත්‍යන්තර යන භාවිතයන් ඇතුළත් කරමින් සංවර්ධනය කළ යුතු අතර, ශ්‍රී ලංකාව ඩිජිටල් යුගයේ ආරක්ෂාව සහ මූලික නිදහස දෙකම ආරක්ෂා කරන බව සහතික කළ යුතුය.

## පාර්ශවකාර උපදේශන ක්‍රියාවලියේ ඌනතාවය

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංවර්ධනය කිරීම හා සම්මත කිරීමේදී අර්ථවත් පාර්ශවකරුවන්ගේ උපදේශන ක්‍රියාවලියක් නොතිබුණි. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සිවිල් සමාජ සංවිධාන, නීති විශේෂඥයින්, ඩිජිටල් අයිතිවාසිකම් සඳහා වාද කළ පාර්ශවයන්, මාධ්‍යවේදීන් සහ තාක්ෂණික අංශයේ නියෝජිතයන් ඇතුළත් නොවීය. මෙම බැහැර කිරීම නිසා නීතියේ නීත්‍යානුකූල භාවයට හානි වී, නොපැහැදිලි අර්ථ දැක්වීම්, අධික බලතල සහ ප්‍රමාණවත් නොවන ආරක්ෂණ ක්‍රම ඇතුළු බොහෝ අඩුපාඩු ඇති විය. අනාගත නීති සම්පාදන ප්‍රතිසංස්කරණයන් සඳහා ප්‍රමුඛත්වය දිය යුත්තේ සියලු පාර්ශව ඇතුළත් කරන, විනිවිද පෙනෙන ක්‍රියාවලියකටයි. එ මගින් ප්‍රජාතන්ත්‍රවාදී වගවීම සහ මානව අයිතිවාසිකම් අනුකූලතාව සහතික කළ හැකිය.

(විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (2024), මාර්ගර්ගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි විශ්ලේෂණය, හියුමන් රයිට්ස් වොච් (2024), ගෝලීය ජාලකරන මුළපිරීම (2024)

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය පිළිබඳ සටහන

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එය විමර්ශනය කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙන්, කෙටුම්පතේ විධිවිධාන කිහිපයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැළපෙන බව හඳුනාගනිමින් සංශෝධන නිර්දේශ කරන ලදී. පනත පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමට පෙර, ආණ්ඩුව එම නිර්දේශ කිහිපයක් ඇතුළත් කළ අතර, ඇතැම් කොටස් නීති විශේෂඥයින් සහ සිවිල් සමාජය අතර විවාදයට ලක්විය. මෙම තත්ත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්ම සහ මානව හිමිකම් ප්‍රමිතීන් සලකා බලා ගන්නා විවෘත සහ සවිස්තරාත්මක සමාලෝචන සහ ප්‍රතිශෝධන ක්‍රියාවලියක අවශ්‍යතාවය ඉස්මතු කළේය.

# මූලාශ්‍ර


1. Access Now. 2024. No Liberty, No Safety: Sri Lanka Must Withdraw the Online Safety Bill. January 19, 2024. https://www.accessnow.org/press-release/sri-lanka-must-withdraw-the-online-safety-bill/.
2. Centre for Policy Alternatives. 2024. FAQs on the Online Safety Bill. January 21, 2024. https://www.cpalanka.org/faqs-on-the-online-safety-bill/.
3. Financial Times. 2024. “Online Safety Act (OSA): A Policy Perspective at a Public Dialogue.” Daily FT. https://www.ft.lk/columns/Online-Safety-Act-OSA-a-policy-perspective-at-a-public-dialogue/4-758399.
4. Global Network Initiative. 2024. GNI Welcomes Sri Lanka’s Plans to Reconsider the Online Safety Act. March 10, 2024. https://globalnetworkinitiative.org/gni-welcomes-sri-lankas-plans-to-reconsider-online-safety-act/.
5. Hattotuwa, Sanjana. 2024a. Sri Lanka’s Online Safety Act: Risks and Threats to New Zealand’s Diaspora. July 16, 2024. https://sanjanah.wordpress.com/2024/07/16/sri-lankas-online-safety-act-risks-and-threats-to-new-zealands-diaspora/.
6. Hattotuwa, Sanjana. 2024b. The OSA’s Impact on Online Memorialisation, Collections, and Archives. June 5, 2024. https://sanjanah.wordpress.com/2024/06/05/the-osas-impact-on-online-memorialisation-collections-archives/.
7. Hattotuwa, Sanjana. 2024c. Amending the Online Safety Act and the Centrality of Human Rights Principles. Groundviews, November 7, 2024. https://groundviews.org/2024/11/07/amending-the-online-safety-act-and-the-centrality-of-human-rights-principles/.
8. Hattotuwa, Sanjana. 2025a. Sri Lanka’s Online Safety Act: A Year in Review and Framework for Reform. Global Network Initiative, March 3, 2025. https://globalnetworkinitiative.org/sri-lankas-online-safety-act-a-year-in-review-and-framework-for-reform/.
9. Hattotuwa, Sanjana. 2025b. What No Amendment Can Fix: Sri Lanka’s Online Safety Act’s Latest Attempt at Legitimacy. February 2025. https://www.linkedin.com/pulse/what-amendment-can-fix-sri-lankas-online-safety-acts-hattotuwa-ph-d--udfec/.
10. Human Rights Watch. 2024. Sri Lanka’s Proposed Internet Law Threatens Upcoming Elections. January 23, 2024.




# Download

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (2024)

Download the Online Safety Act
Sinhala version

---

Download the Online Safety Act
English version

---

Download the Online Safety Act
Tamil version